7 ශ්‍රේණිය - පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශය (2021 ඔක්තෝබර් 25 සිට 2022 මාර්තු 31 දක්වා කාල සීමාව තුළ ආවරණය කිරීම සඳහා යෝජිත විෂය අන්තර්ගතය)

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| අප ජීවත් වන ප්‍රදේශය<br>6.2<br>ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් සමාජයේ යහපැවැත්මට දායක කර ගනියි | 6.2.1<br>තමා ජීවත් වන ප්‍රදේශයේ සම්පත් අගය කරමින් ඒවා සංරක්ෂණය කිරීමට කටයුතු කරයි | • තම ප්‍රදේශයේ පිහිටීම<br>• භෞතික සම්පත් හඳුනා ගැනීම<br>• මානව සම්පත් හඳුනා ගැනීම | 01 |
| | 6.2.2<br>ප්‍රදේශවාසීන් සමඟ සාමූහිකත්වයෙන් යුතු ව ජීවත්වීමට ඇති සූදානම ප්‍රදර්ශනය කරයි | • ප්‍රදේශවාසීන් අතර සාමූහිකත්වය කැපී පෙනෙන අවස්ථා<br>• සාමූහික ව කටයුතු කිරීමෙන් අත්වන ප්‍රයෝජන | 01 |
| | 6.2.3<br>විවිධ පුද්ගලයින් හා ආයතන, තම දෛනික දිවි පැවැත්මට අවශ්‍ය බව තේරුම් ගෙන කටයුතු කරයි | • අපට උදව් කරන්නන් හා ඉටුවන සේවා<br>• සේවා සපයන්නන්ගේ සහ සේවා ලබන්නන්ගේ යුතුකම් | 01 |

| | | | |
|---|---|---|---|
| යහපත් පුරවැසියෙකු වශයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග<br>6.3<br>යහපත් ගුණාංග වලින් හෙබි සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට සූදානම ප්‍රදර්ශනය කරයි | 6.3.1<br>ආචාරශීලී ව භාෂාව භාවිත කරයි. | • සංවරශීලී ව ප්‍රියමනාප ව හා නිවැරදි ව අන්‍යයන්ට ගෞරවයක් ඇති වන පරිදි භාෂාව භාවිත කිරීම | 01 |
| | 6.3.2<br>අන්මත ගරු කරමින් සාකච්ඡා මගින් සම්මුතිවලට එළඹෙයි | • ප්‍රගුණ කළ යුතු සන්නිවේදන කුසලතා | 01 |
| | 6.3..3<br>මනා විනයකින් හා ශික්ෂණයකින් යුතු ව කටයුතු කරයි | • 'විනය' හා 'ශික්ෂණය' හැඳින්වීම<br>• මනා විනයක් හා ශික්ෂණයක් පවත්වා ගෙන යාමේ වැදගත්කම | 02 |
| | 6.3.4<br>සමාජයේ පවතින සරු දේ සරු දේ ලෙස හඳුනාගෙන පිළිගන්නා අතර නිසරු දේ නිසරු දේ ලෙස හඳුනා ගෙන ප්‍රතික්ෂේප කරයි | • සමාජයේ ක්‍රියාත්මක වන සරු දේ හඳුනා ගැනීම<br>• සමාජයේ ක්‍රියාත්මක වන නිසරු දේ හඳුනා ගෙන පිටු දැකීම | 01 |
| | 6.3.5<br>සමාජ සම්ප්‍රදාය හා නීතිරීති | • සම්ප්‍රදාය හැඳින්වීම<br>• නීති හැඳින්වීම | 02 |

| | | | |
|---|---|---|---|
| | ගරු කරයි | • නීතිරීති, සම්ප්‍රදායන් ගරු කිරීමේ වැදගත්කම | |
| | 6.3.6<br>සම්පත් අරපිරිමැස්මෙන් පරිහරණය කරයි | • සම්පත් හැඳින්වීම<br>• සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීමේ වැදගත්කම | 02 |
| | 6.3.7<br>පොදු දේපළ වගකීමෙන් යුතුව සුරකියි. | • පොදු දේපළ හැඳින්වීම<br>• පොදු දේපළවල ලක්ෂණ<br>• පොදු දේපළ සුරැකීම හා එහි වැදගත්කම | 01 |
| | 6.3.8<br>පරිසර සංරක්ෂණය මගින් තිරසර සංවර්ධනයට සක්‍රිය ව දායක වෙයි | • 'පරිසරය' හැඳින්වීම<br>• මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයට සිදු වන හානි<br>• පරිසර සංරක්ෂණයේ වැදගත්කම හා අනාගත පරපුරට ආරක්ෂා කර දිය යුතු බව | 02 |
| | 6.3.9<br>දේශීයත්වය අභිමානයෙන් අගය කරයි | • දේශීය දේ හැඳින්වීම<br>• දේශීය දේ අගය කිරීමේ වැදගත්කම | 01 |

7 ශ්‍රේණිය - පුරවැසි අධ්‍යාපනය

| **නිපුණතාව** | **නිපුණතා මට්ටම** | **විෂය අන්තර්ගතය** | **කාලච්ඡේද ගණන** |
|---|---|---|---|
| **අපේ පවුල**<br>7.1<br>යුතුකම් හා වගකීම් ඉටු කිරීම මගින් පවුලේ සාමාජිකයන් අතර යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගනියි | 7.1.1<br>සමාජයක කුඩා ම සහ වැදගත් ම ඒකකය පවුල බව හඳුනා ගෙන යහපත් සාමාජිකයකු ලෙස ස්ථාවර පවුල් ඒකක ගොඩනගා ගැනීමට දායක වෙයි. | • පවුල<br>• පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ<br>• පවුලේ සාමාජිකයකු වශයෙන් අපට ලැබෙන ප්‍රයෝජන | 02 |
| | 7.1.2<br>පවුලේ සාමාජිකයෙකු වශයෙන්, නිවැරදි ජීවන අරමුණු ගොඩනගා ගෙන, ඒවා ඉටු කර ගැනීමට කටයුතු කරයි. | • සාර්ථක දිවි පෙවෙතකට අරමුණක් තිබීමේ වැදගත්කම | 01 |
| | 7.1.3<br>පවුලේ අනන්‍යතාව තහවුරු කර ගනිමින් ආත්මාභිමානය සංවර්ධනය කර ගනියි. | • තමා පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීමේ වැදගත්කම<br>• පවුලේ සාමාජිකයෙකු ලෙෂ වර්ධනය කර ගත යුතු යහපත් ගුණාංග | 01 |

| | | | |
|---|---|---|---|
| | 7.1.4<br>පවුලේ සාමාජිකයින්ගේ ජීවිත සාර්ථකත්වයට හිතකර බලවේග අදාළ පරිදි උපයෝගි කර ගනිමින් අහිතකර බලවේගවලින් වැළකීමට කටයුතු කරයි. | • සමාජයක පවත්නා හිතකර, අහිතකර බලවේග හඳුනා ගැනීම.<br>• හිතකර බලවේග ජීවිතයට ළං කර ගැනීම හා අහිතකර බලවේගවලින් ඈත් වීමට කටයුතු කිරීම | 02 |
| | 7.1..5<br>පවුලේ සාමාජිකයන්ගේ පෞරුෂ සංවර්ධනය උදෙසා ක්‍රීඩා හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | • සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල පවත්නා අගය<br>• කාලය ඵලදායි ලෙස ගත කිරීම | 01 |
| | 7.1..6<br>පවුලේ සාමාජිකයකු වශයෙන් මුහුණපාන ගැටලු හා අභියෝග හමුවේ, විචාරශීලී හා නිර්මාණශීලී චින්තනයෙන් යුතු ව කටයුතු කරයි. | • එදිනෙදා ජීවිතයේ දී ඕනෑ ම පුද්ගලයෙකුට විවිධ අභියෝගවලටමුහුණ පෑමට සිදු වන බව<br>• චිත්තවේග පාලනයෙන් යුතු ව කටයුතු කිරීම හා එහි වැදගත්කම<br>• වෙනස් වන වෙළෙඳ පොළ තත්ත්ව හමුවේ විචාරශිලී ව හා බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙෂ කටයුතු කිරීමේ වැදගත්කම | 02 |
| | 7.1.7<br>පවුලේ යහපැවැත්ම සඳහා වැඩ ලෝකයේ වැදගත්කම සහ පවුලේ ආදායම් පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කර | • පවුලකට මූල්‍යමය සුරක්ෂිතභාවයේ අවශ්‍යතාව, | 01 |

| | | | |
|---|---|---|---|
| | ගනියි. | | |
| | 7.1.8<br>පවුලේ සාමාජිකයෙකු ලෙස තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කරමින් විනයගරුක ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණධර්ම වර්ධනය කර ගනියි. | • පවුලේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම් | 01 |
| | 7.1..9<br>පවුල හා අසල්වාසීන් අතර අන්‍යෝන්‍ය සබඳතා තහවුරු කර ගෙන සහජීවනයෙන් ජීවත් වීමට හුරු වෙයි. | • පවුලේ සාමාජිකයන් සහ ඥාතිත්වය<br>• තම සමීප ඥාතීන් හැඳින්වීම සඳහා භාවිත කරන ඇමතුම් පද<br>• පවුල තුළ ක්‍රියාත්මක වන සිරිත් විරිත්, සම්ප්‍රදායන් හා ඇගයීම් පද්ධතිය<br>• පවුල හා අසල්වාසීන් අතර පවත්නා සබඳතාවල වැදගත්කම | 01 |
| **අපේ ජන සමාජය**<br>7.2<br>ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහපත් පුරවැසියෙකු ලෙෂ කටයුතු කරයි | 7.2..1<br>ජන සමාජයක පවත්නා අන්තර් සබඳතා විමර්ශනය කරයි | • සමාජය හැඳින්වීම<br>• ජන සමාජය තුළ පවතින අන්තර් සම්බන්ධත | 01 |
| | 7..2..2<br>විවිධ මූලාශ්‍රයවලින් ලැබෙන දත්ත හා තොරතුරු ජන සමාජයේ යහපත පිණිස විචාරශීලී ව භාවිත කරයි. | • දත්ත හා තොරතුරු සැපයෙන මුලාශ්‍රය හඳුනා ගැනීම<br>• එම තොරතුරු විචාරශීලී ව භාවිත කිරීමේ වැදගත්කම | 01 |

| | | | |
|---|---|---|---|
| | 7.2.3<br>ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් නීතිමය රාමුව තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමට හුරු වෙයි. | • තමන්ට හිමිවන අයිතිවාසිකම් හඳුනා ගැනීම<br>• එම අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම්<br>• නීතිමය රාමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමේ වැදගත්කම | 01 |
| | 7.2.4<br>රැකියා ස්ථානයේ වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් සුරකින නීති පිළිබඳ ගවේෂණය කරයි. | • වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් සුරකින නීති | 01 |
| | 7.2.5<br>ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මුහුණපාන අභියෝග හමුවේ නිර්මාණශීලී ව කටයුතු කරයි. | • ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මුහුණපාන අභියෝග<br>• එම අභියෝග සාර්ථක ව ජය ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | 01 |
| | 7.2.6<br>ජන සමාජයේ යහපත උදෙසා තම යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කරයි. | • සමාජ යහපත සඳහා පුරවැසියෙකුගෙන් ඉටු විය යුතු යුතුකම් | 01 |
| **අපේ සංස්කෘතිය**<br>7.3<br>බහුසංස්කෘතික සමාජයක් තුළ සාමකාමී ව යහපත් | 7.3.1<br>සෑම සංස්කෘතියක ම දක්නට ලැබෙන පොදු හා විශේෂ ලක්ෂණ විශ්ලේෂණය කරයි. | • සංස්කෘතිය නිර්වචනය කිරීම<br>• සෑම සංස්කෘතියක ම දක්නට ලැබෙන පොදු ලක්ෂණ<br>• එක් එක් සංස්කෘතියට අනන්‍ය වූ විශේෂ ලක්ෂණ | 01 |

| | | | |
|---|---|---|---|
| පුරවැසියෙකු ලෙස ජීවත් වෙයි | | | |
| | 7.3.2<br>තම සංස්කෘතික දායාද මෙන් ම අන්‍ය සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමට දායක වෙයි. | • තම සංස්කෘතික දායාද හඳුනා ගැනීම<br>• ඒවා ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම<br>• අන්‍ය සංස්කෘතික දායාද හඳුනා ගැනීම හා ඒවාට ගරු කිරීමේ වැදගත්කම | 01 |
| | 7.3.3<br>ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත නිවැරදි ව භාවිත කරමින් ඒවාට ගරු කරයි. | • ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත | 02 |
| | 7.3.4<br>ස්වකීය සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතික සමගිය ගොඩ නැගීමට ප්‍රමුඛතාව දී කටයුතු කරයි. | • තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතික සමගිය ගොඩනැගීම | 01 |
| | 7.3.5<br>යහපත් පුරවැසියෙකු සතු සාරධර්ම අගය කරයි | • සමාජ යහපැවැත්ම සඳහා සාරධර්මවල අවශ්‍යතාව<br>• අප විසින් සුරැකිය යුතු හා ගරු කළ යුතු සාරධර්ම | 01 |